**ජාතික ක්‍රීඩා අරමුදල - 2022**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ජාතික ක්‍රීඩා අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

ජාතික ක්‍රීඩා අරමුදලේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1973 අංක 25 දරන ක්‍රීඩා පනතේ 25 (2) වගන්තිය | 2022 වර්ෂය සඳහා අරමුදලේ පරිපාලනය පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2023 අගෝස්තු 18 දිනට ප්‍රථම පිළියෙල කර ලබා දිමට කටයුතු කරමි. | පරිපාලන වාර්තාවක් පිළියෙල කල යුතු විම. |
| | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | | | |
| | මුදල් රෙගුලාසි 877 (1) (ඇ) සහ (ඈ) | 2022 වර්ෂයේ ජාතික ක්‍රීඩා අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | අයවැය අධ්‍යක්ෂජනරාල් වෙත සහ රාජ්‍ය මුදල් ජනරාල් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අරමුදල් අයවැය සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගත යුතු විම. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 877 (2) (ඇ) ඡේදය | සමාලෝචිත වර්ෂය සඳහා ජාතික ක්‍රීඩා අරමුදලේ කාර්යසාධන වාර්තාවක් පිළියෙල කර නොතිබුණි. | 2022 වර්ෂය සඳහා කාර්යය පරිපාලන වාර්ථාවක් පිළියෙල කර කඩිනමින් ලබා දීමට නියමිතය. | කාර්යය සාධන වාර්තාවක් පිළියෙල කල යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 193,190,265 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 12,466,602 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි **රු.180~~79~~**,723,663 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට අරමුදලේ ආදායම රු.187,652,998 වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ක්‍රීඩකයින්ගේ පෝෂණ දීමනා සඳහා 2022 වර්ෂයේ අයවැය මගින් රු.10,000,000 ක වෙන්කර සංශෝධිත අයවැය මගින් එය රු.2,650,000 දක්වා අඩුකර තිබුණි. 2022 වර්ෂයේ මේ සඳහා වැය කල සත්‍ය වියදම රු. 2,601,004 ක් වූ අතර එයින් රු.1,191,004 ක් විදේශීය පුහුණුව ලබන ක්‍රීඩකයින් දෙදෙනෙකු සඳහා මාසිකව ගෙවනු ලැබූ දීමනා සහ රු.1,410,000 ක් උසස් කාර්යසාධන වැඩසටහන යටතේ අනුග්‍රහය දක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා දෙනු ලබන පෝෂණ දීමනා විය. 2021 වර්ෂයේ වැය කල රු.8,215,107 ක වියදමට සාපේක්ෂව 2022 වර්ෂයේ වියදම | ක්‍රීඩා අරමුදලේ මුදල් යෙදවිය යුතු කාර්යන් අතර ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම ප්‍රධාන කාර්යක් ලෙස විශේෂයෙන් ඇතුළත් කර නොමැත. අරමුදලේ මුදල් ප්‍රමාණය සලකා පෞද්ගලික අංශයේ අනුග්‍රහය ද, ක්‍රීඩකයන් පෝෂණ තත්ත්වය පිළිබඳ ක්‍රීඩා අධ්‍යක්ෂක ජනරාල්ගේ නිර්දේශ මත උසස් දක්ෂතා සහිත ක්‍රිඩක ක්‍රිඩිකාවන්ට පෝෂණ දිමනා ලබා දී ඇත . | ක්‍රීඩකයන්ගේ කාර්ය සාධනය වර්ධනය කිරීම සඳහා පෝෂණ තත්ත්වය ඉහල දැමීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සියයට 68 න් අඩු වී තිබුණි. ඒ අනුව පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ අතිරික්තය වර්ධනය වුවද ක්‍රීඩකයින්ගේ පෝෂණ තත්ත්වය ඉහළ නැංවීම සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | | |
| (ආ) | 2022 වර්ෂයේ මුල් අයවැය අනුව රු.4,600,000 ක් වූ පුහුණුකරුවන් සඳහා සුහසාධන දීමනා සංශෝධිත අයවැය මගින් කපාහැර තිබුණු අතර මේ අනුව ක්‍රීඩකයින්ගේ කාර්යසාධනය කෙරෙහි සෘජුවම බලපාන පුහුණුකරුවන්ගේ අභිප්‍රේරණය නැංවීම කෙරෙහි ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණි. | ක්‍රීඩාවේ දියුණුව වෙනුවෙන් ක්‍රීඩා පනතේ විධිවිධාන අනුව අමාත්‍යතුමාට පැවරි ඇති බලතල ක්‍රීඩා සංවර්ධන දෙපාර්තුමේන්තුවේ නිර්දේශය සලකා අමාත්‍යතුමාගේ අනුමැතිය පරිදි ගෙවීම් සිදුකර ඇත. | ක්‍රීඩා සංවර්ධනය කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතු වීම. |
| (ඇ) | ක්‍රීඩා හැකියාවන් නංවාලීම අරමුණු කරගෙන අරමුදලේ කාර්යයන් කරගෙන යා යුතුව තිබුණද තිබුණ ද, 2022 වර්ෂයේ අයවැය මගින් ක්‍රීඩකයින්, පුහුණුකරුවන් හා නිළධාරින්ගේ හැකියා වර්ධනය සඳහා වෙන්කර තිබුණු රු.21,500,000 ක ප්‍රතිපාදනයන් සංශෝධිත අයවැය මගින් රු.300,000 ක් දක්වා සියයට 98.6 කින් අඩුකර තිබුණි. | ක්‍රීඩකයින්ගේ හා පුහුණුකරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරිමට මෙම වැය විෂය යටතේ ගෙවීම් සිදු කරනු අතර එම වැඩ සටහන් පැවැත්විම සීමා විම හේතුවෙන් සහ අපේක්ෂිත පරිදි ආදායම් එකතු නොවිම හේතුවෙන් අයවැය සංශෝධනය කර ඇත. | ක්‍රීඩා හැකියාවන් නංවාලිමට ක්‍රීඩා අරමුදල් යෙදවිම කෙරෙහි අවධානය යොමු කලයුතු විම. |
| (ඈ) | ක්‍රීඩා සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වූ ජාතික ක්‍රීඩාවන් 66 ක් පැවතිය ද 2022 වර්ෂයේදි ජාතික ක්‍රීඩා අරමුදල විසින් ජාතික ක්‍රීඩා 21 ක් සඳහා පමණක් රු. 167,437,307 ක් වූ මූල්‍ය අනුග්‍රහකත්වයක් ලබා දී තිබුණි. එම අගයෙන් රු. 38,388,967 ක් එනම් සියයට 23 ක් මලල ක්‍රීඩාව සඳහා ද , රු. 32,918,499 ක් එනම් සියයට 19.6 ක් නෙට්බෝල් ක්‍රීඩාව සඳහා ද , රු. 15,000,000 ක් එනම් සියයට 8.9 ක් රග්බි ක්‍රීඩාව සඳහා | අනෙකුත් සංගම්/ සම්මේලන හා ක්‍රීඩක ක්‍රීඩිකාවන් නගා සිටුවිම උදෙසා ක්‍රීඩා අමාත්‍යවරයා සතු බලතල ප්‍රකාරව වරින් වර මූල්‍ය අනුග්‍රහය ලබා දි ඇත. | පිළිගත් ප්‍රතිපත්තියකට අනුව ජාතික ක්‍රීඩා සඳහා ධෛර්ය දිම සහ සංවර්ධනය කෙරෙහි අවධානය යොමු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ද වැය කර තිබුණි. මේ අනුව වැය කල අගයෙන් සියයට 51.5 ක් ජාතික ක්‍රීඩා 03 ක් වෙනුවෙන් පමණක් වැය කර තිබුණි. ජාතික ක්‍රීඩා 66 ක් පැවතිය ද ජාතික ක්‍රීඩා 21 ක් සඳහා පමණක් අරමුදලේ මූල්‍යාදායකත්වය ක් ලබාදීම හේතුවෙන් ජාතික ක්‍රීඩා සඳහා ධෛර්යදීම, සහ සංවර්ධනය කිරීම කෙරෙහි ජාතික ක්‍රීඩා අරමුදල විසින් ප්‍රමාණවත් අවධානය යොමු කර නොතිබුණි. | | |
| (ඉ) | අන්තර් පාසල් ක්‍රීඩා කටයුතු නගාසිටුවීම වෙනුවෙන් විශේෂ අවධානයක් යොමුකර නොතිබුණ අතර ක්‍රීඩා තරඟ වලට සහභාගී වීම සඳහා එක් දිස්ත්‍රික්කයක පාසල් 3ක් සඳහා පමණක් සඳහා රු. 300,000 ක් වැය කර තිබුණි. | පාසල් මට්ටමේ සිට ක්‍රීඩාව නගා සිටුවීම උදෙසා වරින් වර ජාතික ක්‍රීඩා අරමුදලින් මූල්‍ය අනුග්‍රහය ලබා දී ඇත. | පාසල් මට්ටමේ සිට ක්‍රීඩාව නගා සිටු විමට විධිමත් ක්‍රමවේදයකට අනුව කටයුතු කල යුතු විම. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොදු රාජ්‍ය මණ්ඩලීය හා ආසියානු ක්‍රීඩා උළෙල ඉලක්ක කරමින් උසස් කාර්යසාධන වැඩසටහන යටතේ ක්‍රීඩකයින්ගේ හැකියාවන් වර්ධනය කර අදාළ තරඟ ජයග්‍රහණය කිරීම අපේක්ෂාවෙන් තෝරාගත් ක්‍රීඩා සඳහා අනුග්‍රහය ලබා දී තිබුණද පිහිනීම, ජිම්නාස්ටික්, ස්කොෂ්, මේස පන්දු, බාස්කට්බෝල්, බීච් වොලිබෝල්, ක්‍රිකට් (කාන්තා),රග්බි සහ මල්ලව පොර යන ක්‍රීඩාවන් 9 ක් සඳහා මෙම වැඩසටහන යටතේ අනුග්‍රාහකත්වය ලැබී නොතිබුණි. ඒ අනුව, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙල නියෝජනය කල 116 ක් වූ සමස්ථ ක්‍රීඩක ක්‍රීඩිකාවන් අතරින් 78 දෙනෙකු එනම් සියයට 67 ක් සඳහා මෙම වැඩසටහන යටතේ අනුග්‍රහය ලබාදී නොතිබුණි. | ක්‍රීඩා සභාව විධිමත් නිකුත් කර ඇති නිර්නායක මත පදනම්ව මේ වන විට ගෙවීම් සිදු කරනු ලබයි. | විධිමත් අනුමත ක්‍රමවේදයකට අනුව ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අනුග්‍රහය ලබා දිය යුතු වීම. |

| | | |
|---|---|---|
| (ආ) පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ කාන්තා නිදහස් ආර කිලෝග්‍රෑම් 57 බර පංතියේ මල්ලව පොර තරඟයෙන් ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක් හිමි කර දුන් මල්ලව පොර ක්‍රීඩාව උසස් කාර්යසාධන වැඩසටහන යටතේ දීමනා ලැබීමට තෝරාගත් ක්‍රීඩා ඉසව්වක් නොවීම තුළින් ශ්‍රී ලංකාවට ලෝකඩ පදක්කමක් හිමිකර දීමට සමත් වූ ක්‍රීඩිකාවට උක්ත වැඩසටහන යටතේ ලැබිය යුතු දීමනාව සහ මාසික පෝෂණ දීමනාව අහිමිව තිබුණි. | එම | එම |

### 3.3 කොන්ත්‍රාත් පරිපාලන අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මාතර කඹුරුපිටිය බොක්ෂිං ක්‍රීඩාගාරය සඳහා ගොඩනැගිල්ලක් සකස් කිරීම සහ කඹුරුපිටිය වොලිබෝල් ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීම සඳහා ජාතික ක්‍රීඩා අරමුදල විසින් මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත රු.9,157,992 ක මුදලක් ලබාදී තිබූ අතර මුළු කොන්ත්‍රාත් වියදම රු.7,265,483 ක් විය. ඉතිරි මුදල වන රු.1,892,509 ක් 2022 ජනවාරි සිට 2023 ජූලි දක්වා වසරකුත් මාස හයක කාලයක් තුළ මාතර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙහි පොදු තැන්පත් ගිණුමෙහි තැන්පත් කර ඇතත් එම මුදල් ජාතික ක්‍රීඩා අරමුදල වෙත ආපසු ලබාගැනීමට හෝ වෙනත් සංවර්ධන කාර්යයන් සඳහා යෙදවීමට හෝ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි මෙම මුදල් කඩිනමින් අරමුදල සඳහා බැර කිරිමට කටයුතු කරනු ලැබේ . | වෙනත් රාජ්‍ය ආයතන මගින් සංවර්ධන කටයුතු සිදු කිරීමේදී ලබාදෙන ප්‍රතිපාදන සම්බන්ධ විධිමත් හා ප්‍රමාණවත් පසු විපරම් කටයුතු සිදු කළ යුතුය. |